සමගි ජන බලවේගය
ஐக்கிய மக்கள் சக்தி • Samagi Jana Balawegaya

අංක 592, බංගලා හන්දිය,
කෝට්ටේ පාර, පිටකෝට්ටේ.
0112 870 211
0112 870 212
info@sjb.lk

2024.02.01

**මාධ්‍ය නිවේදනය.**

සමගි ජන බලවේගය සමඟ එකතු වූ හිටපු යුධ හමුදාපති දායා රත්නායක මහතා මව්බිම ජනතා පක්ෂය සමඟ එකතු වූවා යැයි හැඟෙන ප්‍රවෘත්තියක් සමාජ මාධ්‍ය ජාලා හරහා සංසරණය වෙමින් පවතී.

මෙය අසත්‍ය පුවතක් වන අතර එවැනි සිදුවීමක් සිදු වී නොමැති බව අවධාරණය කරමු.

සංසරණය වන ඡායාරූපය පැරණි ඡායාරූපයක් වන අතර එවැන්නක් භාවිතා කොට සිදු කරනු ලබන දේශපාලන ප්‍රචාරයන් අපි තරයේ හෙලා දකිමු.

සමගි ජන බලවේගය ශක්තිමත් කිරීම සඳහා විවිධ පාර්ශවයන් ඒකරාශිවීම තුළ මෙවැනි අසත්‍ය ප්‍රචාරයන් ඉදිරියේදී ද සිදුවිය හැක.ඒ පිළිබඳව දැඩි අවධානයෙන් අපි පසුවෙමු.

මෙවැනි ඡායාරූප පල කිරීමට පෙර අදාළ පාර්ශවයක් වන ජනරාල් දයා රත්නායක මහතා විමසා කටයුතු කිරීම සිදු කලේ නම් එය යහපත් මාධ්‍ය භාවිතයක් බවද පෙන්වාදෙනු කැමැත්තෙමි.

**සුජීව සේනසිංහ,**
ජනාධිපති මැතිවරණ මෙහෙයුම් ප්‍රධානී.